# පූර්ව හා පශ්චාත් ගර්භණී මව්වරුන්ගේ මානසික ආතතිය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**කේ.ඒ.පී ලක්ෂිකා**[1]

**වසන්තා සුබසිංහ**[2]

## සංක්ෂේපය

සමාජයේ පවත්නා සංස්ථා අතුරින් පවුල කුඩාම සංස්ථාව වේ. නව පවුල් සංස්ථාවක් ගොඩනගා ගනු ලබන සෑම කාන්තාවකගේම, පිරිමියෙකුගේම ඊළඟ අපේක්ෂාව වන්නේ දරුවෙකු පවුලට එකතු කර ගැනීමයි. මෙහිදී කාන්තාවක මවක වීම යනු, ඇයගේ කය මෙන් ම මනස ද වෙනස්කම් රාශියකට ලක්වන ක්‍රියාවලියකි. කාන්තාවක සෑම විටම සුව පහසු වාතාවරණයක් යටතේ ගර්භනීභාවයට පත්වීම හෝ ගර්භණීභාවයෙන් පසු අවධිය තුළ ද ඇයට සුව පහසු වාතාවරණයක් සෑම විටම බලාපොරොත්තු විය නොහැක. මෙහිදී කාන්තාවක් ගෘහයේ වැඩ කටයුතු, සැමියාගේ මෙන් ම දරුවන්ගේ වැඩ කටයුතු, රැකියාවක් කරන්නේ නම් ආයතනික වැඩ කටයුතුත් සමඟ ගර්භණීභාවයට මුහුණ දෙන්නේ නම් හෝ ගර්භණීභාවයෙන් පසුව දරුවාත් සමඟ ගෙවන්නාවූ කාලය තුළදී ද මෙවන් වූ වගකීම් සමුදායක් පවතින විට පූර්ව හා පශ්චාත් ගර්භණී කාන්තාවන්ට මානසික ආතතිය ඇතිවීම අපේක්ෂා කළ හැකි තත්ත්වයකි.
පර්යේෂණ ගැටලුවඃ පූර්ව හා පශ්චාත් ගර්භණී මව්වරුන්ට මානසික ආතතිය ඇතිවීමට බලපාන හේතු සාධක මොනවාද?
පර්යේෂණ පරමාර්ථයඃ පූර්ව හා පශ්චාත් ගර්භණී මව්වරුන්ට මානසික ආතතිය ඇතිවීමට බලපාන හේතු සාධක සමාජ විද්‍යාත්මකව අනාවරණය කර ගැනීම.
පර්යේෂණ අරමුණුඃ පූර්ව හා පශ්චාත් ගර්භනීභාවය හා ඒ හා සම්බන්ධ කායික හා මානසික වෙනස්කම් හඳුනා ගැනීම, මානසික ආතතිය යනු කුමක්ද හා එයට බලපාන හේතු සාධක හඳුනා ගැනීම, පූර්ව හා පශ්චාත් ගර්භණී මව්වරුන්ට මානසික ආතතිය ඇතිවීමට බලපාන හේතු සාධක හඳුනා ගැනීම, මානසික ආතතිය අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කිරීම.
න්‍යායාත්මක පසුබිමඃ කෘත්‍යාත්මක පර්යාලෝකය.
පර්යේෂණ ක්‍රමවේදයඃ ප්‍රමාණාත්මකව සිදුකරන ලද පර්යේෂණයක් වන බැවින් සමීක්ෂණ විධික්‍රමය භාවිත කරමින් ප්‍රශ්නාවලී ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත ලබා ගන්නා ලදි.
නියැදියඃ සසම්භාවී නොවන නියැදිය යටතේ අරමුණුගත නියැදියක් තෝරාගත් අතර එම නියැදියට පූර්ව ගර්භණී මව්වරුන් 25 දෙනෙකු හා පශ්චාත් ගර්භණී මව්වරුන් 25 දෙනෙකු ඇතුළත් කරගනු ලැබීය.

මෙම පර්යේෂණයේදී ලබාගත් තොරතුරුවලට අනුව අනාවරණය වූයේ පූර්ව හා පශ්චාත් ගර්භණී සමය තුළ ඇතිවන කායික, මානසික වෙනස්කම්, පවුල තුළ වැඩ කටයුතු අධික වීම, පවුලේ ආර්ථික අපහසුතා, ජීවත් වන පරිසරය ආශ්‍රිතව පවතින කැලි කසල, ශබ්දය වැනි ගැටලු, රැකියා ස්ථානයේ වැඩ අධික වීම හා ආයතනික ප්‍රධානීන්ගෙන් සිදුවන බලපෑම් මෙන් ම රැකියාවට යාම සඳහා යොදා ගන්නා ප්‍රවාහන මාධ්‍ය තුළ පවතින තදබදය, ශබ්දය යන කාරණාවන් ඔවුන්ට මානසික ආතතිය ඇතිවීමට හේතු වී ඇති බවයි.

*1. සමාජවිද්‍යාව, සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*